# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/27 – 2013 අගෝස්තු 29 වැනි බ්‍රහස්පතින්දා – 2013.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ හැටහයේ කෝරළේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලාවැහැර ගමේ පිහිටි එච්. ඩබ්ලිව්. අශෝක ජයලාල් කච්චේරි මිනින්දෝරු විසින් පිළියෙල කර ඇති 2004/42 දරන පිඹුරේ කැබලි අංක 1, 2, 3, 4 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.8938 ක් පමණ වූ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක 1, 2, 3, 4 – ඇල්ලහේන වත්ත නොහොත් කටුමැටියාව – ප්‍රමාණය: හෙක්. 0.8938

උතුරට: අජිත් ගාමිණී හිමිකම් කියන ඉඩම සහ එච්. ඩී. ගුණවර්ධන හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: ඒ. ජී. ඩිංගිරියා සහ තවත් අය හිමිකම් කියන ඉඩම; දකුණට: එස්. ඩී. ගුණසේකර හිමිකම් කියන ඉඩම, අලවුදීන් සහ තවත් අය හිමිකම් කියන ඉඩම; බටහිරට: මහා මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 03/ජේ/92/පීසී/173.
2013 ජුලි මස 11 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 300



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.